# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) 2012
2015 මාර්තු/ අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය
**සිංහල - SINH E 2025**

**සංස්කෘතිය, ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය**

<u>1 කොටසින් එක් ප්‍රශ්නයක් ද, 11 කොටසින් එක් ප්‍රශ්නයක් ද, 111 කොටසින් ප්‍රශ්න දෙකක් ද ඇතුළත් වනසේ ප්‍රශ්න (05) පහකට පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව: 10 යි. කාලය : පැය 03 යි.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1 කොටස

01. 'සංස්කෘතිය' සංකල්පය පැහැදිලි කොට, භෞතික හා අභෞතික සංස්කෘතීන් අතර පවත්නා සම්බන්ධතාව කෙබඳුද යි විග්‍රහ කරන්න.

02. උපසංස්කෘතියක් යනු කුමක්ද යි හඳුන්වා, උපසංස්කෘති නිර්මාණය වීමට බලපාන සාධක පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

03. වර්තමාන ජනප්‍රිය සංස්කෘතිය මඟින් සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සංස්කෘතිය කෙරෙහි ඇති කෙරෙන බලපෑම පිළිබඳ ඔබේ නිරීක්ෂණ පහදන්න.

11 කොටස

04. ජනකවිය පිළිබඳ විශේෂාවධානයක් යොමු කරමින් සාම්ප්‍රදායික සිංහල ජන ජීවිතය අධ්‍යයනයෙහි ලා ජනශ්‍රැතියෙන් සැපයෙන පිටුබලය කෙබඳුද යි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

05. ස්වභාව ධර්මය විෂයෙහි සාම්ප්‍රදායික සිංහලයන් සතුව පැවැති දැනුම ප්‍රස්තාව පිරුළුවල කෙබඳු අයුරින් සටහන් වී ඇත්ද යි නිදසුන් සහිතව දක්වන්න.

06. 'යසෝදරාවත හුදු පද්‍ය සංග්‍රහයක් වශයෙන් පමණක් නොව, තත් කාලීන සමාජ පිළිගැනීම් හා විශ්වාසයන් හඳුනාගත හැකි මූලාශ්‍රයක් වශයෙන් ද අගය කළ හැකි වෙයි.' විමසන්න.

111 කොටස

07. විවිධ භාෂා පවුල් පිළිබඳ හැඳින්වීමක් කොට, සිංහලය ඉන්දු යුරෝපීය භාෂාවක් බවට විද්‍යමාන ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රයාගත හා වාග්විද්‍යාත්මක සාධක පිරික්සන්න.

<u>නැතහොත්</u>

'සිංහලයෙහි අනාර්ය භාෂා ලක්ෂණ ද්‍රාවිඩීය භාෂා සංස්කෘතික සම්පර්කය නිසා සිද්ධ වූවකි.' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

08. ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම වර නැඟීමේ විශේෂතාව පිළිබඳ අවධානය යොමු කරමින් සිදතෙහි ලිංග වර්ගීකරණය පිළිබඳ විමසීමක් කරන්න.

<u>නැතහොත්</u>

නිත්‍ය සන්ධි යනු කුමක්දැ යි පැහැදිලි කොට සිදත් සඟරාවේ සන්ධි විග්‍රහය පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

09. 'අර්ථ සම්පන්න වාක්‍යයක මූලික පදනම ක්‍රියා කාරක පද සම්බන්ධයයි.' කාරක විභක්ති පිළිබඳ අවධානය යොමු කරමින් යථෝක්ත ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පහදන්න.

10. අනාගත කාලික ක්‍රියා රූපය පිළිබඳ සිදත්සඟරා කතුවරයාගේ ඉගැන්වීම් විමසුමට ලක් කරන්න.

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගිනි)